④ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1998/2 - 2016 දෙසැම්බර් මස 19 වැනි සඳුදා - 2016.12.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත

නියමය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9අ වගන්තියේ (ඇ) ඡේදයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය ෆයිසර් මුස්තෆා වන මම, 1987 මැයි මස 11 වැනි දින අංක 453/24 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයකින් සංස්ථාපනය කරන ලද තමන්කඩුව ප්‍රාදේශීය සභාව, පොළොන්නරුව මහා නගර සභාව සහ පොළොන්නරුව ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කිරීම සඳහා 2017.06.30 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි විසුරුවා හරිමි.

ෆයිසර් මුස්තෆා,
පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය.

2016 දෙසැම්බර් මස 17 වැනි දින,
කොළඹ දී ය.

12 - 1311/1

### මහා නගර සභා ආඥාපනත

නියමය

252 අධිකාරය වූ මහ නගර සභා ආඥාපනතේ 2, 3, 5 සහ 9 වැනි වගන්ති සහ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 27 ඊ වගන්තියේ (3) වන උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය ෆයිසර් මුස්තෆා වන මම, මෙම නියමයෙන් -

(1) මෙහි උපලේඛනයේ I වැනි කොටසේ නිරූපිත ප්‍රදේශය එම ආඥාපනතේ කාර්යය සඳහා මහා නගරයක් විය යුතු යැයි ප්‍රකාශ කරමි.

(2) එම උපලේඛනයේ II වැනි කොටසේ දක්වා ඇති සීමා, එම මහා නගරයේ පරිපාලන සීමා ලෙස නියම කරමි.

(3) මෙම නියමයේ (1) වැනි ඡේදය යටතේ ප්‍රකාශයට පත් කරන ලද මහා නගරය සඳහා මහා නගර සභාවක් සංස්ථාපනය කර, එම මහා නගර සභාවට පහත සඳහන් නාමය පවරමි.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

"පොළොන්නරුව මහා නගර සභාව"

(4) පොළොන්නරුව මහා නගර සභාව,

i. මහා නගර සභා ආඥාපනතේ 5 වන වගන්තියේ (1) උප වගන්තියේ (අ) වන ඡේදය යටතේ තෝරා පත්කර ගත යුතු සභිකයින් හය දෙනෙකුගෙන් ද,

ii. මහා නගර සභා ආඥාපනතේ 5 වන වගන්තියේ (1) උප වගන්තියේ (ආ) ඡේදය යටතේ පත්කර ගත යුතු එක් සභිකයකුගෙන් ද,

iii. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 27 ඊ වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ තෝරා ගත යුතු කාන්තා සභිකයින් දෙදෙනෙකුගෙන්ද,

සමන්විත විය යුතු යැයි නියම කරමි.

(5) පොළොන්නරුව මහා නගර සභාවේ ධූර කාලය ආරම්භ විය යුතු දිනය 2017.07.01 වැනි දිනය වශයෙන් නියම කරමි.

ෆයිසර් මුස්තාෆා,
පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය.

2016 දෙසැම්බර් මස 17 වැනි දින,
කොළඹ දී ය.

උපලේඛනය

I වැනි කොටස

තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි පහත සඳහන් ග්‍රාමා නිලධාරී කොට්ඨාසවලින් සමන්විත භූමි ප්‍රදේශය :

(153) බැදිවැව, (155) ඇතුමල්පිටිය, (155A) සිරිසඟබෝ පෙදෙස, (162) වීර පෙදෙස, (163) පුලතිසි පෙදෙස, (167) පොත්ගුල් පෙදෙස, (168) උඩවෙල, (169) මහවැලි පෙදෙස, (170) නිශ්ශංකමල්ල පෙදෙස, (171) තෝපා වැව, (172) පොළොන්නරුව නගරය, (178) ගල්තඹරාව (179) කුරුප්පු හන්දිය, (180) මහසෙන් පෙදෙස, (183) කදුරුවෙල බටහිර, (184) කදුරුවෙල දකුණ, (185) පැරකුම් පෙදෙස (186) කදුරුවෙල නැගෙනහිර,

II වැනි කොටස

පොළොන්නරුව මහා නගර සභාවේ පරිපාලන සීමා :

| | | |
|---|---|---|
| උතුරට | : | ඇතුගල්පිටිය ග්‍රාම නිලධාරී වසමේ උතුරු හා නැගෙනහිර මායිම් ද, බැදිවැව, ගල්තඹරාව සහ කදුරුවෙල නැගෙනහිර ග්‍රාම නිලධාරී වසම්වල උතුරු මායම් ද ගල්තඹරාව, කුරුප්පු හංදිය සහ මහසෙන් පෙදෙස ග්‍රාම නිලධාරී වසම්වල නැගෙනහිර මායිම් ද ; |
| නැගෙනහිරට | : | කදුරුවෙල දකුණ, පැරකුම් පෙදෙස, වීර පෙදෙස ග්‍රාම නිලධාරි වසම්වල නැගෙනහිර මායිම් ද ; |
| දකුණට | : | වීර පෙදෙස, නිශ්ශංකමල්ල පෙදෙස, උඩවෙල, පොත්ගුල් පෙදෙස ග්‍රාම නිලධාරි වසම්වල දකුණු මායිම් ද ; |
| බස්නාහිරට | : | පොත්ගුල් පෙදෙස, තෝපා වැව, බැදිවැව, ඇතුමල්පිටිය, සිරිසඟබෝ පෙදෙස ග්‍රාම නිලධාරි වසම්වල බටහිර මායිම ද වේ. |

12 - 1311/2

## 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත

## නියමය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන්, 4 වන වගන්තියෙන්, 6 වන වගන්තියෙන් සහ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 27 ඊ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය ෆයිසර් මුස්තාෆා වන මම මෙම නියමයෙන් -

(1) මෙහි උපලේඛනයේ I වැනි කොටසේ නිරූපිත ප්‍රදේශය එම පනතේ කාර්යය සඳහා ප්‍රාදේශීය සභා ප්‍රදේශයක් විය යුතු යැයි ප්‍රකාශ කරමි.

(2) එම උපලේඛනයේ II වැනි කොටසේ දක්වා ඇති සීමා, එම ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ පරිපාලන සීමා ලෙස නියම කරමි.

(3) මෙම නියමයේ (1) වැනි ඡේදය යටතේ ප්‍රකාශිත ප්‍රාදේශීය සභා ප්‍රදේශය සඳහා ප්‍රාදේශීය සභාවක් සංස්ථාපනය කර, එම ප්‍රාදේශීය සභාවට පහත සඳහන් නාමය පවරමි.

''පොළොන්නරුව ප්‍රාදේශීය සභාව''

(4) පොළොන්නරුව ප්‍රාදේශීය සභාව,

i. ප්‍රාදේශීය සභා ආඥා පනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) වන ඡේදය යටතේ තෝරා පත්කර ගත යුතු සභිකයින් 10 දෙනෙකුගෙන් ද,

ii. ප්‍රාදේශීය සභාපනතේ 4 වන වගන්තියේ (1) වගන්තියේ (ආ) ඡේදය යටතේ පත්කර ගත යුතු සභිකයින් 3 දෙනෙකුගෙන් ද,

iii. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 27 ඊ වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ තෝරා ගත යුතු කාන්තා සභිකයින් 4 දෙනෙකුගෙන් ද,

සමන්විත විය යුතු යැයි නියම කරමි.

(5) පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ ධූර කාලය ආරම්භ විය යුතු දිනය 2017.07.01 වැනි දිනය වශයෙන් නියම කරමි.

ෆයිසර් මුස්තාෆා,
පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය.

2016 දෙසැම්බර් මස 17 වැනි දින,
කොළඹ දී ය.

උපලේඛනය

I වැනි කොටස

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි පහත සඳහන් ග්‍රාම නිලධාරී කොට්ඨාසවලින් සමන්විත භූමි ප්‍රදේශය :

(154) සමුද්‍රගම, (156) නිකවැව, (157) සිංහ උදාගම, (158) කඩවල වැව, (159) නැගෙනහිර අළුත්වැව, (160) බටහිර අළුත්වැව, (161) ගනන්ගොල්ල, (164) පරාක්‍රම සමුද්‍රය, (165) අඹන්ගඟ, (166) කලහගල, (173) පලුගස්දමන 01 ඇල, (174) පලුගස්දමන 02 ඇල, (175) පලුගස්දමන 03 ඇල, (176) පලුගස්දමන අතුර, (177) පලුගස්දමන දකුණ, (181) මානික්කම්පට්ටිය, (182) නෙලුම්විල, (187) ගල්ලැල්ල, (188) ගල්ලැල්ල බටහිර, (189) කොටලීය, (190) කාලිංග ඇල, (191) දමන ගැමුනුපුර, (192) දිවුලාන, (193) පුදූර්, (194) සිංහරාජපුර, (195) ඕනෑගම, (196) විජයරාජපුර, (197) මැදමලුව, (198) ලක්ෂ උයන, (199) නිශ්ශංක මල්ලපුර, (200) සේවාගම, (201) වැවේ තැන්න, (202) මොණරතැන්න, (203) විජයබාහුපුර, (204) සිංහපුර, (205) උණගල, වෙහෙර දකුණ, (206) ශාන්තිපුර.

II වැනි කොටස

පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමා :

| | | |
|---|---|---|
| උතුරට | : | හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාවේ නැගෙනහිර මායිමේ කොටසක් හා ලංකාපුර ප්‍රාදේශීය සභාවේ දකුණු මායිම ද ; |
| නැගෙනහිර | : | දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ බටහිර මායිම ද ; |
| දකුණට | : | කලහගල ග්‍රාම නිලධාරී වසමේ දකුණු මායිම සහ නැගෙනහිර මායිමේ කොටසක් ද ; |
| බස්නාහිරට | : | කලහගල ග්‍රාම නිලධාරී වසමේ බටහිර මායිම ද. තුළ පිහිටි පොළොන්නරුව මහා නගර සභාවේ පරිපාලන සීමා. |

12 - 1311/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.